රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/99

මගේ අංකය :- ආ/IV/2/81,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1999 ජුනි මස 16 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## විශ්‍රාමිකයින් සඳහා ජීවන වියදම් දීමනා ගෙවීම

උක්ත කරුණට අදාළ 1993.05.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/93 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 1993.01.01 දිනට පෙර විශ්‍රාම ලබා ඇති අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප රු. 4060/- ක් හෝ ඊට අඩුමුදලක් ප්‍රදානය කරනු ලැබූ සියළුම විශ්‍රාමිකයින්ට රු. 260/- ජීවන වියදම් දීමනාව ගෙවීමට රජය තීරණය කර ඇත. **දැනටමත් මෙම දීමනාව ගෙවා ඇති විශ්‍රාමිකයින් සඳහා මෙය අදාළ නොවේ.**

03. 1993.01.01 දිනට පසු විශ්‍රාම ලබා ඇති අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප රු. 4060/- ක් හෝ ඊට අඩු මුදලක් ප්‍රදානය කරනු ලැබූ සියළුම විශ්‍රාමිකයන්ට ද මෙම දීමනාව ගෙවනු ලැබේ. **දැනටමත් මෙම දීමනාව ගෙවා ඇති විශ්‍රාමිකයින්සඳහා මෙය අදාළ නොවේ.**

04. 1988.01.01 දින සිට 1996.12.31 දක්වා කාලයට මෙම හිඟ ජීවන වියදම් දීමනාව ගෙවිය යුතුය. 1988.01.01 සිට එක් එක් මාසය වෙනුවෙන් ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව පහත දැක්වෙන පරිදි විය යුතුය.

| | | | |
|---|---|---|---|
| 1988 | ජනවාරි | - | රු. 156/- |
| | පෙබරවාරි | - | රු. 204/- |
| | මාර්තු | - | රු. 212/- |
| | අප්‍රේල් | - | රු. 204/- |
| | මැයි | - | රු. 222/- |
| | ජුනි | - | රු. 240/- |
| 1988 | ජුලි සිට | | රු. 260/- බැගින් |
| 1996 | දෙසැම්බර් දක්වා | | |

05. එක් එක් විශ්‍රාමිකයාට මෙම දීමනා ගෙවීමේදී ඔවුන් විශ්‍රාම ගිය දිනය පිළිබඳව පරීක්ෂාකර්ව ගෙවීම් කිරීමට විශේෂයෙන් සැළකිලිමත් විය යුතුය. ඊට අමතරව මෙම විෂයය පිළිබඳව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් වරින් වර නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් ද සැළකිල්ලට ගත යුතුය.

06. මේ යටතේ ගෙවීම් හිමි විශ්‍රාමිකයන්ගේ මාසික විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97 අනුව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ 1997.02.05 දිනැති අංක 01/97 චක්‍රලේඛය යටතේ 1997.01.01 දින සිට සංශෝධනය කර ගෙවීම් කළ යුතු බව දන්වමි.

07. මෙම දීමනාව දැනට මාසික විශ්‍රාම වැටුප් ගෙවනු ලබන කාර්යාල මගින්ම ගෙවනු ලැබේ.

08. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ද ඇතිව නිකුත් කරන ලදී.



(පී.ඒ. සේනාරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.